රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 26/2016

මගේ අංකය: EST-7/ALOWN/06/0007/04
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2016.11.16

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ද්විභාෂා/ත්‍රෛභාෂා හැකියාවන් සහිත සම්පත්දායකයින්ගේ දත්ත පදනමක් ස්ථාපිත කිරීම</u>**

ද්විභාෂා/ත්‍රෛභාෂා හැකියාවන් සහිත සම්පත්දායකයින්ගේ දත්ත පදනමක් දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීමට 2016.03.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. ජාතික සමගිය හා සංහිඳියා කාර්යාංශය විසින් අයදුම්පත් කැඳවා, රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පවත්වනු ලැබූ ලිඛිත, ශ්‍රවණ කුසලතා හා කථන පරීක්ෂණයෙන් සමත් සම්පත්දායකයින්ගේ දත්ත (නම, ලිපිනය, දුරකථන අංකය, ඊමේල් ලිපිනය ආදිය) ඊට අදාළ වෙබ් අඩවිය වන www.bashawa.lk ඔස්සේ දැනටමත් ප්‍රකාශයට පත් කර ඇත.

03. වාර්ෂිකව මෙම සම්පත්දායක දත්ත පදනමට බඳවා ගැනීම් සඳහා වන විභාග, රාජ්‍ය භාෂා කොමසාරිස් විසින් පවත්වනු ලැබේ. ඒ සඳහා රාජ්‍ය සේවයේ නිලධරයන්ට, විශ්‍රාමික නිලධරයන්ට, පෞද්ගලික අංශයේ නිලධරයන්ට මෙන්ම දැනට සේවයක නිරත නොවන පුද්ගලයින්ට ද ඉල්ලුම් කළ හැකිය.

04. ද්විභාෂා හා ත්‍රෛභාෂාවන්ගෙන් රාජකාරි කටයුතු කිරීම සඳහා දැනටමත් රාජ්‍ය ආයතන බඳවා ගෙන සිටින නිලධරයන්ගේ සේවය ප්‍රශස්ත මට්ටමින් ලබා ගැනීමට කටයුතු කළ යුතු වන අතර, එසේ කළ නොහැකි අවස්ථාවල දී පමණක් ඉහත 02 ඡේදයේ සඳහන් සම්පත්දායකයින් මගින් රාජකාරි ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.

05. මෙම දත්ත පදනමෙහි ඇතුළත්ව සිටින සම්පත්දායකයින්ගේ සේවය ලබා ගැනීමේදී පහත සඳහන් පරිදි ගාස්තු ගෙවිය හැකිය.

I. 2016.03.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණ අනුව මෙම දත්ත පදනමෙහි ඇතුළත් නිලධරයන්ගේ සේවය රාජ්‍ය ආයතන වෙත ලබා ගැනීමේ දී පරිවර්තනය කිරීම සඳහා උපයෝගී කර ගනු ලබන ලියවිල්ලෙහි සඳහන් වචන සංඛ්‍යාව පදනම් කර ගනිමින් එක් වචනයකට රුපියල් 2.50 බැගින් ගෙවීම.

II. දෛනිකව සේවය ලබා ගන්නේ නම් පැය 08ක සේවා කාලයක් වෙනුවෙන් රුපියල් 1000/- ක් (රුපියල් දහසක්) ගෙවීම.

III. කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගන්නේ නම් මාසිකව රුපියල් 30,000/- ක් (රුපියල් තිස්දහසක්) ගෙවීම.

IV. පරිවර්තනය සඳහා වූ යතුරු ලියන/පරිගණකයේ මුද්‍රණය කිරීම වෙනුවෙන්, 2016.08.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2003(III) හි 04 ඡේදයේ විධිවිධාන අනුව ගෙවීම.

06. මෙම සම්පත්දායකයින්ගේ සේවය තම ආයතනයට ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් ඔවුන්ගේ ගෙවීම් කටයුතු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයට වෙන් කර ඇති වැය විෂයයන් යටතේ ලබා දී ඇති ප්‍රතිපාදන සීමාවන් තුළ අදාළ වියදම් දැරීමට ආයතන ප්‍රධානීන් වග බලා ගත යුතුය.

07. මෙම දත්ත පදනමට අයත් සම්පත්දායකයින්ගේ සේවාව ලබා ගන්නා ආයතන ප්‍රධානීන් ඔවුන්ගේ සේවාවේ ගුණාත්මක බව පිළිබඳව රාජ්‍ය භාෂා කොමසාරිස් වෙත ත්‍රෛමාසිකව වාර්තා කළ යුතුය.

08. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ හා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය